# ?පින්බර ලංකා? ජනපති අතින් විවෘත වෙයි

ලියන ලද්දේ Museum Department
2011 මැයි 23 වෙනි සඳුදා, 06:17 - අවසන් යාවත්කාලීන කිරීම 2011 ජූනි 03 වෙනි සිකුරාදා, 09:48



පින්බර ලංකා ප්‍රදර්ශනය ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අතින් මැයි 18 දා කොළඹ ජාතික කෞතුකාගාර පරිශ්‍රයේදී විවෘත කෙරිණි............

ශ්‍රී ලාංකයේ ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම රජ කෙනෙකු වූ දුටුගැමුණු රජතුමන්ගේ භෂ්මාවශේෂ ඇතුළු ඉපැරණි පුරාවස්තු රැසක් ප්‍රදර්ශනය කෙරෙන පින්බර ලංකා ප්‍රදර්ශනය ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ අතින් මැයි 18 දා කොළඹ ජාතික කෞතුකාගාර පරිශ්‍රයේදී විවෘත කෙරිණි. ස්වර්ණාලෝපිත බුද්ධ ප්‍රතිමා, රන් කරඬු, රන් සන්නස්, රන්පත් ඉරු වැනි අති දුර්ලභ පුරාවස්තු මෙහිදී ප්‍රදර්ශනය කෙරේ. ලක්දිව එක්සේසත් කළ ශ්‍රේෂ්ඨ නරපති දුටුගැමුණු රජතුමන්ගේ භෂ්මාවශේෂ නැරඹූ ජනාධිපතිතුමා එයට පුෂ්පෝපහාර ද දැක්වීය.
2600 වන ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තියට සමගාමී ව ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යංශය සංවිධාන කර ඇති පින්බර ලංකා ප්‍රදර්ශනය ලබන 31 වැනි දින දක්වා පැවැත්වේ.
පූජ්‍ය දිවියාගහ යසස්සී හිමියන් ඇතුළු මහා සංඝරත්නය ද ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය ජගත් බාලසූරිය ඇතුළු මැතිඇමැතිවරුන් ද ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යංශයේ ලේකම් කාන්ති විජේතුංග, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායක, ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ආචාර්ය නන්දා වික්‍රමසිංහ හා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ මහත්ම මහත්මීන් ද ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක් ව සිටියහ

{besps}/News/2011/pinbaralanka{/besps}